1 වෙනි පිටුවෙන් -

දම්වැලේ දුබලම පුරුක

රැල්ලක් දියත් කළ නමුත් එයද පසුගිය සති දෙක තුනේදී ව්‍යවර්ථව ගිය බව පෙනේ. කවරදාකවත් අපි යුඇන්පිය ට හවුල් නොවෙමු යයි පුන පුනා කී මේ ජේවීපීකාරයින් දැන් රනිල් වික්‍රමසිංහ සමගද සන්ධාන සඳහා සාකච්ඡා කළ බවක් පළ විය. පිරිහීමෙක තරම!

සතුරු බලවේග එහෙමමය

සියල්ල මෙසේ සිදුවෙන අතරේ අප වටහාගත යුතු වැදගත්ම කරුණ වන්නේ සතුරු බලවේග පරාජය වී නැති බවයි. බටහිර රටවල විශේෂ යෙන් කැනඩාවේ සිටින දෙමළ කොටි ඩයස්පෝරාව දැනට නිහඬව සිටියත් නිශ්ක්‍රීය වී නැති බව සිතා ගැන්ම වටී. එසේම කොටින්ගේ විශාල ධනස්කන්ධයද එසේම පවතී. සමහර විට දැනුදු ලංකාවේ හතු පිපෙන්නාක් මෙන් ඇතිවී ජනතාව මුලාකරන අමූලික බොරු ප්‍රචාරය කරන සමහර වෙබ් අඩවි පිටුපස ඇත්තේ කාගේ මුදල්ද? එක් කළෙක කොටි මුදල් සාම කාක්කන් සහ කොටි හිතවාදී එන්පීඕ සඳහා වැයවූ හැටි අපි හොඳාකාරව දුටුවෙමු. දැන් කොටි සල්ලි වෙනත් මාර්ගයකින් වැඩ කරන බව පෙනේ. මේ සියළු සිදුවීම් තුළින් ප්‍රකටව පෙනෙන්නේ ඒ බාහිර සතුරු බලවේග අභ්‍යන්තර සතුරන් හා එක්ව කිසියම් විශාල කුමන්ත්‍රණකාරී වැඩ පිළිවෙලක් දියත් කර ඇති බවයි.

දුර්වලම පුරුක (The weakest link)

එක් සුප්‍රසිද්ධ යුද්ධ උපක්‍රමයක් නම් දුර්වලම පුරුක පිළිබඳ න්‍යායයි. එය කෙටියෙන් මෙසේය. සතුරු බලකොටුවක් බිඳීමට අදහස් කරන ප්‍රහාරක හමුදා විසින් කළයුතු කාර්යය නම් සතුරා රැකවලට දා ඇති ශක්තිමත් දම්වැලක පුරුක් අතරින් දුර්වලම පුරුක සෙයො එය බිඳීමයි එවිට දම්වැල කඩාගෙන ඇතුළට යා හැකිය.

රුසියානු විප්ලවයේදී මෙම යුද්ධ උපක්‍රම න්‍යාය ලෙනින් විසින් 1917 රුසියානු විප්ලවය සාර්ථකව කරලීමට දේශපාලන උපක්‍රමයක් වශයෙන් යොදාගනු ලැබිණ. විසිවන ශතවර්ෂය මුල දී ලෝක ධනපති බලකඳවුර බ්‍රිතාන්‍යය, ප්‍රංශය, ජර්මනිය, ජපානය සහ රුසියාව යන අධිරාජ්‍යයන් එකට වෙළී පවතිමින් ශක්තිමත් බලකොටුවකව පැවතියේය. (ඒ වනවිට ඇමරිකානු අධිරාජ්‍යවාදය මතුවී නොතිබිණ මේ බලකොටුවේ දුර්වලම පුරුක රුසියාව බව ලෙනින් විශ්ලේශනය කොට හඳුනාගත්තේය. විශාල ඉඩම් හිමි රදල පාලක රැලක් ප්‍රමුඛ රජ පෙළපතක් බලයේ සිටි අතර කර්මාන්ත අංශ නිශ්පාදන අතින් නොදියුණු තත්වයක තිබිණ. එබැවින් මුල සඳහන් කළ ධනපති ලෝකයේ දුර්වලම පුරුක රුසියාව විය. මෙය දෙදරවා හැරී මෙන් ධනවාදී ලෝකය බිඳලීම කළහැකිය යනු වෙන් ලෙනින් පෙන්වා දුන්නේය. රුසියානු විප්ලවය සාර්ථක කරලීමෙන් පසු බ්‍රිතාන්‍ය අධිරාජ්‍යය ප්‍රමුඛ ධනවාදී ලෝකය වසර පණහක කාලයක් තුළ කඩා වැටුණු ආකාරය අපි දුටුවෙමු.

රජයේ ඉදිරි ගමන

පසුගිය සමයේ යුද්ධයෙන් අවතැන්වූ කඳවුරු වල සිටි ජනයා කඩිනමින් සහ ආරක්ෂා සහිතව නැවත ගම්වලට පදිංචි කරලීම, ඒ සඳහා මං මාවත්, විදුලි බලය, සෞඛ්‍යය හා අධ්‍යාපනය ආදී පහසුකම් ගොඩනගාලීම ආදී දහසක් කාර්යයන්හි සාර්ථකව යෙදෙමින් රජය ඉදිරියට යමින් සිටී. එසේම රටේ අනෙක් ප්‍රදේශ වලද ඒ සා ප්‍රමාණයේම කලක් අත පසුවී තිබුණු සංවර්ධන කටයුතු රාශියක් ක්‍රියාවට නැගෙමින් පවතී. ජනතාව මේවා හොඳින් දකිති දනිති මේවාට පසුබිම වූයේ ජනතාව හමුදාවල් පරිපාලන දේශපාලන අංශ ආදියේ යුද සමයේ සිට ගොඩනැගී පැවති එකමුතුකමේ ශක්තියයි.

මේ දේ සිදුවනු දුටු ප්‍රතිගාමී සතුරෝ බලකොටුවක්ව පවතින මේ ශක්තිමත් බැම්ම බිඳලීමට දම්වැලේ දුර්වල පුරුකක් ඇති තැනක් සොයමින් සිටියෝය. අප රටේ කවදත් සිදුවන බල ලෝභී දේශපාලන බෙලිකැපිලි, දූෂණ, කේළාම්බස් හා එකිනෙකා කෙටවීම් ආදී උපක්‍රම ජාල තුළින් ඔව්හු මේ දුර්වලම පුරුක සොයා ගත්හ. ඒ දුර්වලම පුරුක නම් අන් කවරෙකුවත් නොව හිටපු හමුදාපති සරත් ෆොන්සේකාය.

යුද සමයේ සිටම යදමකින් බැන්දා සේ එකම අපේක්ෂාවක් සඳහා කටයුතු කළ ත්‍රිවිධ හමුදාපතීන්, ජනාධිපති ආරක්ෂක ලේකම්, රාජපක්ෂ සොහොයුරන් ආදී පිරිස අතරේ යම් යම් මතභේද ඇතිවනු දුටු හතුරෝ ඒ අතරින් දුර්වලම පුද්ගලයා හඳුනාගත්හ. ඔහුගේ මානසිකත්වය කෙබඳුදැයි ඔව්හු දැන සිටියහ. ඔහු මෙහෙයවන්නට හැකිවුවහොත් කෙසේ හෝ එමගින් පවතින රජය අපකීර්තියට පත්කිරීමටත් එම රජයේ ශක්තිය දෙදරවා ලන්නට හැකිකමක් මතුකර ගත හැකියයි ඔව්හු සිතුවෝය. ඒ අනුව වැඩ පිළිවෙලක් දියත් කෙරිණ. යුද්ධයක් ජයග්‍රහණය කළ ඔබ රටේ නායකත්වයටද හොඳම සුදුස්සාය යන වචන ඔහුගේ කනට මතුරා කීහ. නක්ෂත්‍රකරුවන් ලවා කීප වරක් කිසිවෙකුට බිඳලනු බැරි රාජයෝගයක් තිබෙන බවද කියෙව් පසු සතුරන්ගේ උපාය හරියටම හරී ගියේය. එහි අවසාන ප්‍රථිඵලය වූයේ ජෙනරාල් සරත් ෆොන්සේකා නම් හිටපු හමුදාපතිවරයා රටේ ජනාධිපති වීම සඳහා තරඟයට පිවිසීමට යන බව සැලවීමයි.

මේ ආරංචියත් සමග ලංකාවම කැළඹුණ බව සැබෑය. ඒ සමගම හමුදාපතිවරයා සිය ආරක්ෂක මණ්ඩලීය ප්‍රධානියා වශයෙන් සිටි සිය තනතුරෙන්ද ඉල්ලා අස්වීම සැබැවින්ම ඔහු තරහ වදින බවට තහවුරුවීමක් වුවද ඔහු කෙලින් වචනයක් ඒ ගැන කීවේද නැත. ජනතාවට එසේ දෙගිඩියාවෙන් සිටින්නට සති දෙකක් තුනක් ඉඩදී අවසානයේ ගිය සතියේ සරත් ෆොන්සේකා මහතා ස්ථිරවම ප්‍රකාශ කළේ විරුද්ධ පක්ෂ සන්ධානයේ පොදු අපේක්ෂකයා හැටියට තමා ලබන ජනවාරි මස 26 වෙනි දින පැවැත්වෙන ජනාධිපතිවරණයට හංසයා ලකුණෙන් තරඟකරන බවය.

ප්‍රබලතා සහ දුබලතා

එතුමා හමුදා ජෙනරාල්වරයෙකු වශයෙන් යුද්ධයේ ජයග්‍රහණය සඳහා ඇප කැප වී, සාමාන්‍ය හමුදා භටයින් දිරිගන්වමින් ඔවුන් ගැන නිතර සොයාබලමින් රැ දාවල් නොබලා කටයුතු කළේය. යුද්ධ උපක්‍රම නිවැරදිව යෙදවීය. ඒ සියල්ල අප ඉහළින් අගය කරන අතර ඒ පිළිබඳව විස්තර වශයෙන් අපි නොයෙක් විට පළකර ඇත්තෙමු.

නමුත් ඔහු යුද්ධය කෙරෙන අතරේද, යුද්ධය නිමවූ පසුවද හැමවිටම අදහස් ප්‍රකාශ කළේ එම යුද ජයග්‍රහණය තමා තනිවම රටට ගෙනදුන් දෙයක් ලෙසටය. ගුවන්, නාවික, පොලීසිය සහ ග්‍රාමාරක්ෂක භටයින්ගේ දායකත්වයක් ගැන කිසිවිටක කතා කළේ හෝ ජයග්‍රහණයේ ගෞරවය ඔවුන්ටද හිමිවිය යුතුයයි කිසිවිටක කියා නැත. නාවික හමුදාපති අද්මිරාල් වසන්ත කරන්නාගොඩ සමග ඔහුගේ ඇති තදබල නොමනාපය මුළු ලංකාවම හොඳින් දනී. ගුවන් හමුදාවේ ගුවන් ප්‍රහාර සමග නාවික හමුදාව කොටි මුහුදු යාත්‍රා සුන්කිරීම නොකරන්නට කොටි විනාශ කිරීම නොකළ හැකි දෙයක්ව තිබිණ.

යුද්ධයෙහි උපක්‍රමශීලී බවක් තිබුණද සරත් ෆොන්සේකා දේශපාලනයේ උපක්‍රමශීලී බවක් නොපන්වයි. තෝරාගෙන ඇති සගයින් පිරිසත් ඔවුන් හමුවේ ඔහුගේ හැසිරීම් දෙසත් බලන විට ඔහු අසුවී ඇති උගුලේ තරම මනාව පැහැදිලි වේ.

නායක රනිල් වික්‍රමසිංහ ඇතුළු මුළුමහත් විපක්ෂයම යුද සමයේ සිටියේ එම යුද්ධය දිනිය නොහැකිය යන මතයේ පිහිටාය. එපමණක්ද නොව ඔව්හු හැකි හැම විටකම යුද්ධය සමව්වලයට ලක්කළෝය. ජයග්‍රහණයට ඉතා ආසන්න කාලයේ පවා රනිල් පිටරට ගොස් යුද්ධය නවත්වන පිළිවෙලක් කොටි හිතවාදී රටවල් සමග සාකච්ඡා කළේය. ඕන ගොනෙකුට යුද්ධ කරන්න පුළුවනි යයි ලක්ෂමන් කිරිඇල්ලේ කීය. ඔවුන් රජයේ සේනාවන්ගේ සටන් සහ ඉතා අමාරුවෙන් ලත් යුද ජයග්‍රහණය පාච්චල් කළේ එසේය. ඒ පිරිස අද සරත් පොන්සේකාගේ ගජ යහළුවන් බවට පත්ව සිටිති. එපමණක් ද නොව කොටින්ගේ නොම්මර එකේ හිතවාදියා වන මනෝ ගනේෂන් ද, රවුෆ් හකීම් ද දැන් ෆොන්සේකා පිළට එක්වී සිටිති. මේ තක් කඩින්ගේ සහයෝගය හා ආශීර්වාදය ඇතුව සරත් පොන්සේකා මේ සැරසෙන්නේ මහින්ද රාජපක්ෂ ජනාධිපතිවරයා එම තනතුරෙන් පන්නා දැමීම සඳහාය. එහෙත් ජනතාව මෙම කූට උපායන් හඳුනාගෙන ඥාණාන්විතව ක්‍රියාකරනු ඇතැයි අපේ විශ්වාසයයි.

කොළඹ ඉන්නා මාධ්‍යකාරයිනුත්, වෙබ් අඩවි අටවාගත් එන්පීඕ වලට කඹුරන පිරිසකුත්, කූට දේශපාලකයනුත් මොන අන්දමේ ප්‍රවෘත්ති ගෙනහැර පෑවත් ජනතාව මේ සියල්ල විමසිලිමත්ව විශ්ලේෂණය කොට නිවැරදි තීරණයක් ගන්නවා නිසැකය. මෙයට පෙරද කොළඹ අය කළ කී දේ අනුව නොව රටේ බල තුලනය තීරණය කළේ අතිමහත් ගම්බද ජනතාවය. ගැම් දිවියට පුරුදු, අපි වවලයි අපි කෑවේ ආර්ථිකයේ ඉන්නා එම ජනතාව අදද අපේ ආර්ථිකයේ කොඳු නාරටිය වෙයි. ඉදිරිය දෙස සිතා මතා ඉවසීමෙන් ඔවුන් තීරණ ගන්නවා ඇත. නැවෙන් කටට ආර්ථිකයේ ඉන්නා නාගරික පන්තියට මේ තීරණය කළ නොහැකිය.

ප්‍රබල රටවල් කීපයක් විරුද්ධ වෙමින් කෙණහිලිකම් කරද්දී අතිශය අපහසු ත්‍රස්තවාදී යුද්ධයක් සාර්ථකව ජයග්‍රහණය කළ රජයක් පෙරළා දැමීමට ඒ යුද්ධයේ මුල් තැන සිටි මිනිසාම ඉදිරිපත්වීම දෛවයේ සරදමකට වඩා භයානක කුමන්ත්‍රණයක ප්‍රථිඵලයකි. ශක්තිමත් දම්වැල කැඩිය හැකි ඒ දම්වැලේ දුර්වලම පුරුක සතුරෝ සොයාගත්හ. ඔවුන් එම පුරුක ඒ මේ අතකරකවනු අල්ලේ නටවනු අපි දැන් විමසිල්ලෙන් බලා සිටින්නෙමු.

♦ සංජය

දේශපාලනයට ඇතුල්වීම පහදා දීම සඳහා පසුගිය මස කොළඹ හෝටලයක පැවති පුවත්පත් සාකච්ඡාවකදී හිටපු හමුදාපති සරත් ෆොන්සේකා මහතා ප්‍රශ්න ඇසූ මාධ්‍යවේදීන්ට පිළිතුරු දුන් අවස්ථාවයි මේ.



පරණ හමුදාපති සහ නව හමුදාපති (සරත් ෆොන්සේකා සහ ජගත් ජයසූරිය) හමුවූ අවස්ථාවක්. මේ සියළු විපර්යාසයේ පටන්ගැන්ම මෙතැනද?

ප්‍රභාකරන්ගේ දෙමාපියන්ගේ සහ එල්ටීටීඊ සහායත් මට අවශ්‍යයි !

- සරත් ෆොන්සේකා කියයි

ජනපතිවරණ සටනට හංසයා ලකුණෙන් තමා ද අවතීර්ණ වූ බව ප්‍රකාශ කරමින් හිටපු හමුදාපති සරත් ෆොන්සේකා මාධ්‍යවේදීන් අමතමින් අනාවරණය කළේ යුද්ධය පැවති සමයේ යුද්ධයට එරෙහිව නොයෙක් ප්‍රකාශයන් කළ එජාප නායක රනිල් වික්‍රමසිංහ, පාර්ලිමේන්තු මන්ත්‍රී මංගල සමරවීර වැනි අය සමග තමා තුළ කලින් පැවති සියළු අමනාපකම් දැන් ඉවත්ව ඇති බවත්, තමා රාජපක්ෂ රජය පෙරළීමට යන මේ ගමනේදී ඒ තිබූ වෙනස්කම් කිසිසේත් බාධාවක් කර නොගන්නා බවත් ය.

මංගල සමරවීර වරක් ප්‍රකාශ කළේ සරත් පොන්සේකා ශ්‍රීලංකා හමුදාපතිකමට නොව ගැලවීමේ හමුදාවටවත් සුදුසු නැති බවය. මංගල කී ඒ කතාවට එකල ජනතාව කුපිත වී ඔහුට නොසෑහෙන්නට බැන වැදුණෝය. එදා රජය සහ මැති ඇමතිවරු කවුරුත් මංගල හෙළා දුටහ. ත්‍රස්තවාදීන්ට එරෙහිව නැගී සිටි හමුදාපති වැනි කෙනෙකුට එසේ අවමන් කිරීම ගැන පුවත් පත් සහ රූප මාධ්‍ය මගින් දැඩි විවේචන මංගලට ද එජාපයේ වාචාල මන්ත්‍රීන්ටද එල්ලකරන ලදී. මංගලගේ අවමානය මතක දැයි මාධ්‍යවේදියෙක් නැගූ ප්‍රශ්නයට පිළිතුරු දෙමින් සරත් පොන්සේකා කීවේ එවැනි කතා දැන් ඇදලාගැන්ම අනවශ්‍ය බවත් ඒ අතීත විරුද්ධවාදීන් සියල්ලන් දැන් තමා සමග එකම අරමුණකට වැඩකරන මිතුරන් බවත්ය.

යුද සමයේ කොටින්ට හිතවාදීව වැඩ කළ, ප්‍රකාශයන් කළ, යූ ඇන්පී ප්‍රධාන විරුද්ධවාදීන් සමග සරත් පොන්සේකා දැන් එක්ව සිටීම ඔහුට එරෙහිව ඇති ප්‍රධානතම චෝදනාවයි. යුද්ධ ක්‍රියාන්විතයන්ට හරස් වෙමින්, විදේශ රටවල්වල ගැත්තන් වෙමින්, අනියම් ලෙස කොටින්ට පක්ෂපාතී වෙමින්, ඇතැම් විට එක්සත් ජාතීන්ගේ හමුදා පවා ශ්‍රීලංකාවට ගෙන්වා ගන්නට යත්න දරමින්, කොටින්ගේ පරාජයට සැබැවින්ම දුක්වූ සතුරු පිරිසක් හා කෙසේ ඒ යුද්ධය මෙහෙයවූ සෙන්පතියා දැන් එක්ව සිටින්නේද යන්න ජනතාව විපිළිසර කළ කරුණකි. එයට පිළිතුරු දෙමින් හිටපු හමුදාපති සරත් ෆොන්සේකා මෙසේ පැවසීය.

" දේශපාලනයෙදි සදාකාලික සතුරන් හෝ සදාකාලික මිතුරන්යයි වර්ග කරන්න බැහැ. මේ රජය පරාජයට පත්කරන්න සියළු පක්ෂවල සහාය මට ලැබෙන බව මට විශ්වාසයි. දැනට ඉතිරිව ඉන්න කොටි සාමාජිකයන්ගෙනුත් මම ඉල්ලන්නෙ, මට උදව් කරන්න කියලා. එච්චර විතරක් නෙවෙයි, ප්‍රභාකරන්ගෙ අම්ම තාත්ත හරි උදව්වට එනව නම් මම එය පිළිගන්න කැමතියි. මේ කාර්‍යයට සල්ලි උවමනාකර නවා. මට ලැබෙන පැන්ෂන් එකෙන් මේ ඡන්ද ව්‍යාපාරය ගෙනියන්න බැහැ. ඒනිසා මම කාගෙත් උදව් බලාපොරොත්තුවෙනවා. කොටින්ගෙන් හරි, කොටි නොවෙන අයගෙන් හරි."

13 වන සංශෝධනය හා බලය බෙදා දීම පිළිබඳ නැගූ ප්‍රශ්නයකට පිළිතුරු දුන් ෆොන්සේකා පැවසුවේ ඒ පිළිබඳව ඔහු වටා දැන් සිටින හවුල්කාරයින් සමග පසුව සාකච්ඡා කොට තීරණයක් ගන්නා බවයි.

තමාගේ දේශපාලන සටන බිඳ හෙලන්නට වර්තමාන එක්සත් ජනතා නිදහස් සංධාන රජය යටිකුට්ටු ව්‍යාපාරයක් ගෙනියන බවට චෝදනා කළ ඔහු ජනාධිපති මහින්ද රාජපක්ෂ නොවැදගත් බාල ජනාධිපතිකෙනෙක් ලෙසට හැඳින්වීය. එසේම ඔහු ඒකාධිපතියෙකු බවත්, යුද්ධයේ හමුදා ජයග්‍රහණය ඔහු පුද්ගලිකව ලැබූ ජයග්‍රහණයක් ලෙසට සිතා සිටින අතර ඉන් වාසි ලැබීමට යත්න දරන බවත්ය.

ෆොන්සේකා ප්‍රකාශයට රජයේ ප්‍රතිචාරය

හිටපු හමුදානායක ජෙනරාල් සරත් පොන්සේකා පුවත්පත් සාකච්ඡාවේදී ප්‍රකාශ කළ දේ රජයේ පමණක් නොව ස්වාධීනව කල්පනා කරන බොහෝ දෙනාගේ නොමනාපයට හා කලකිරීමට හේතුවී ඇත. විශේෂයෙන් ඔහු එල්ටීටීඊයෙන් උදව් ඉල්ලීම කිසිසේත් අනුමත කළ නොහැකි බව සියල්ලෝ කියති. දරුණු ම්ලේච්ච යුද්ධයකින් ජය ලැබ, මාස හයක් ගතවන්නටත් පෙර ඒ යුද්ධය මෙහෙයවූ සෙන්පතියාම සතුරා වර්ණනා කරමින් සතුරාගෙන් උදව් පැතීම ඒ ජයග්‍රහනය කිලිටි කිරීමක් මෙන්ම, රජය, හමුදාව සහ එයට සහාය දුන් ජනතාව පාවාදීමක් බව ඔව්හු පවසති. එමෙන්ම ඒ සෙන්පතියාගේ නිවටකම විදහා දැක්වීමක් ද බව පෙන්වා දෙති.